# මෑතකාලීනව ශ්‍රී ලංකාවේ ක්‍රියාත්මක දිළිඳුකම පිටුදැකීමේ ව්‍යාපෘති හා එහි විකාශය

ජේ.ඒ.කසුන් මධුෂාන් ජයසිංහ[1]

**සංක්ෂේපය**

ශ්‍රී ලංකාව තවමත් පූර්ණ සංවර්ධිත තත්ත්වයට ප්‍රවේශ නොවීම නිසා දිළිඳුබව සමාජය තුළ මුල් බැස ගත් ගැටළුවක් බවට පත්ව ඇත. දිළිඳුකම පිටුදැකීම සඳහා ආහාර මුද්දර, ජනසවිය, සමෘද්ධි වැඩසටහන, ගැමිදිරිය, දිවි නැගුම ආදී විවිධ වැඩසටහන් ක්‍රියාත්මකව ඇති අතර එතුළින් ආර්ථික වෘද්ධියක් ඇති කිරීම, මානව ප්‍රාග්ධන වර්ධනය, සහභාගීත්ව සංවර්ධනය ප්‍රධාන අරමුණු විය. එක් එක් දිළිඳුබව පිටුදැකීමේ වැඩසටහනෙහි ස්වභාවය හා එහි අන්තර්ගතය පිලිබඳ ද්වීතියික මූලාශ්‍ර වන වාර සඟරා, පොත්පත් ඔස්සේ හැදෑරීමක් කෙරෙන අතර දිළිඳුජන කොටස් කේන්ද්‍රගත නොවීම, දේශපාලන අත පෙවීම්, ආයතනික ව්‍යුහයේ ගැටළු ආදී වූ විවිධාකාර කරුණු මත ඉහත වැඩසටහන් මඟින් අපේක්ෂිත අරමුණු හා ඉලක්ක වෙත ළඟා වී නොමැති බව දැකිය හැකි ය.

**මුඛ්‍ය පදඃ** දිළිඳුකම, දිළිඳුකම පිටුදැකීමේ ව්‍යාපෘති, සහභාගීත්ව සංවර්ධනය, ආර්ථික වෘද්ධිය

## හැඳින්වීම

1977 දී විවෘත ආර්ථික ප්‍රතිපත්තිය ශ්‍රී ලංකාව තුළ ක්‍රියාත්මක කිරීමත් සමඟ එතෙක් ක්‍රියාත්මක වූ සමාජවාදී ආර්ථික මොඩලය වෙනුවට නිදහස් වෙළඳපල ආර්ථික රටාවක් හෙවත් ලිබරල් ආර්ථිකයකට පදනම වැටිණි. පැවැති වෙළෙඳපොළ බාධක ඉවත්ව වෙළෙඳපොළ නිදහස්කරණයත් සමඟ ආර්ථික වෘද්ධි උපාය මාර්ග තුළින් පමණක් මෙරට පවතින දරිද්‍රතාව අවම කිරීමට අපේක්ෂා කළත් එම අරමුණ කරා ළඟාවීම අපහසු බව තහවුරු වීමත් සමඟ 2000 සහශ්‍ර සංවර්ධන අභිමතාර්ථ සාක්ෂාත් කර ගැනීම සඳහා දරිද්‍රතාව පිටුදැකීම අවශ්‍ය බැවින් ආර්ථික වෘද්ධියේ ප්‍රතිඵල දිළිඳුජනතාව වෙත ප්‍රවේශ වන ප්‍රතිපත්තිය වෙත යොමු වීමක් පසුගිය දශක

[1] ශාස්ත්‍රවේදී (විශේෂ) ආර්ථික විද්‍යා තෙවන වසර, kasunmj1991@gmail.com

කිහිපය තුළ දැකිය හැකි විය. ඒ අනුව දිළිඳුකම අඩුකරමින් ආර්ථික වෘද්ධිය වේගවත් කර ගැනිමට යොමු වූ සංවර්ධන උපාය මාර්ග සහිත ආර්ථික ප්‍රතිපත්ති ක්‍රියාවට නැංවීම සිදුවිය. මේ යටතේ සුළු හා මධ්‍ය පරිමාණ කර්මාන්ත අංශ නගා සිටුවීම, ක්ෂුද්‍ර මූල්‍ය ශක්තිමත් කිරීම, ග්‍රාමීය යටිතල පහසුකම් සංවර්ධනය, ග්‍රාමීය ජනතාව සවිබල ගැන්වීම, දිළිඳුසහන වැඩසටහන් ආදිය ක්‍රියාත්මක විය. නිදහසින් පසු ශ්‍රී ලංකාවේ මේතාක් සුබසාධන රාජ්‍යය සංකල්පය විවිධ ස්වරූපයන්ගෙන් ක්‍රියාත්මක වන අතර එමගින් පවතින ආදායම් ව්‍යාප්තියේ විසමතාව අවම කිරීමටත් දිළිඳු ජනතාවගේ ජීවන තත්ත්වය උසස් කිරීමත් අපේක්ෂාව විය.

## දිළිඳුකම හා දිළිඳුකම පිටුදැකීම සඳහා ගෙන ඇති ප්‍රයත්නයන්

"අවම මූලික අවශ්‍යතාවයන් ඉටුකරගැනීමට ප්‍රමාණවත් ආදායම් නොලැබීම" දිළිඳුකම යන්නෙන් අරුත් ගැන්වෙන අතර නිදහසින් පසු මේ දක්වා කාලය තුළ ශ්‍රී ලංකාවේ දිළිඳුකම පිටුදැකීම හා මානව සංවර්ධනයේ සාපේක්ෂ වර්ධනයක් දක්නට ලැබේ. කෙසේ වෙතත් ඉහත දැක්වූ පරිදි විවිධ සුබසාධන ව්‍යාපෘති ක්‍රියාත්මක වුවද මෙරට දරිද්‍රතාව යම් ඉහල අගයක පවතිනු දැකිය හැක. 2012/13 ජන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තු දත්ත වාර්තා අනුව මෙරට ජනගහණයෙන් මිලියන 1.3 ක් පමණ දරිද්‍රතාවෙන් පසුවන අතර නිල දරිද්‍රතා ඉම මාසිකව රු. 3624කි. 2009/10 වර්ෂයේ 8.9% වූ දරිද්‍රතා අනුපාතය2012/13 දී 6.7% දක්වා අඩු වී ඇත. සිවිල් අරගල, අවම යටිතල පහසුකම්, කම්කරු ආරවුල්, පෝෂණ හීනතා, විෂම ආදායම් ව්‍යාප්තිය, භෞතික නිෂ්පාදන සම්පත්වල අහිමි බව, සමාජ සජීවීකරණය මන්දගාමී වීම, ස්වාභාවික ආපදා මෙරට දරිද්‍රතාව ඉහල තලයක පැවැතීමට හේතු වූ සාධක ලෙස හඳුනාගත හැක.

සංවර්ධනය වන රටක් වශයෙන් ශ්‍රී ලංකාවේ වැඩිවන ජනගහණයට සාපේක්ෂව ආර්ථික වෘද්ධියක් ලඟා කරගත නොහැකි වීමත්, කුටුම්භ ඒකක ගණන වැඩිවීම නිසා කුටුම්භ වියදම වැඩිවීමත්, ඒ නිසා ඉතුරුම් සීඝ්‍රයෙන් පහල ගොස් එය ආයෝජන කෙරෙහි ඇති කරන සෘණාත්මක බලපෑමෙන් නැවත නිෂ්පාදන හා ආර්ථික වෘද්ධියේ පසුබෑමක් ඇතිවේ. මෙම චක්‍රීය ප්‍රවාහය දුගී බවේ දුෂ්ඨ චක්‍රය ලෙස හැඳින්වේ. මේ නිසා මෙයින් මිදීම උදෙසා රජයන් විසින් විවිධ සුබසාධන ව්‍යාපෘති පවතින සමාජ පසුබිමට උචිත පරිදි වරින් වර ඉදිරිපත් කර ඇති අතර ආහාර මුද්දර, ජන සවිය, සමෘද්ධි වැඩසටහන, ගැමිදිරිය, දිවි නැගුම ආදී ව්‍යාපෘති ඒ අතර විය.

**ආහාර මුද්දර ක්‍රමය**

ආහාර මුද්දර ක්‍රමය දිස්ත්‍රික්ක 25 න් 17 කම ක්‍රියාත්මක විය. 1990 සිට මෙම ක්‍රමය උතුරු නැගෙනහිර පළාත්වල ඇතැම් කොටස්වල ක්‍රියාත්මක වීම තාවකාලික වශයෙන් අත්හිටුවා ඇත. 1991 වර්ෂයේදී ආහාර මුද්දර පවුල් 1886194 ක පුද්ගලයන් 6795849 ක් ආහාර මුද්දර ලැබීමට සුදුසුකම් ලැබූහ. ආහාර මුද්දර වැඩසටහන ප්‍රතිව්‍යුහගත කරමින් උප දිසාපති කොට්ඨාශ මට්ටමින් දිළිඳු සහ තරමක් දිළිඳු පවුල් වශයෙන් හඳුනාගනු ලැබීය. ඒ අනුව දිස්ත්‍රික් මට්ටමින් සිදු කරන ලද සමීක්ෂණයට අනුව ආහාර මුද්දර ලැබීමට සුදුසු පවුල් සංඛ්‍යාව 769504 කි. අනාවරණය වු දත්ත අනුව නව දිළිඳුපවුල් 132373 ක් හඳුනාගත හැකි වී ඇත. ප්‍රතිව්‍යුහගත කරන ලද ආහාර මුද්දර ක්‍රමයට එම පවුල් ඇතුලත් වේ (ගමගේ, 1998).

**ජනසවිය වැඩසටහන**

1989 බලයට පත් වූ ආණ්ඩුව විසින් ජනසවිය වැඩසටහන ශ්‍රී ලංකාවේ දිළිඳු ජනතාව නගා සිටුවීමේ අරමුණින් ක්‍රියාත්මක කරන ලදි. මෙය ජනතාව මුල්කොටගත් ඔවුන්ගේම වැඩසටහනකි. ජනසවිය වැඩසටහනේ අරමුණ වූයේ දිළිඳුජනතාවගේ කුසලතා සහ හැකියා වැඩි දියුණු කිරිමට ආයෝජනය කිරීමෙන් ඔවුන්ගේ ජීවන තත්වය උසස් කිරීමයි. ජනසවිය සඳහා තෝරාගනු ලබන්නේ ආහාර මුද්දරලාභී පවුල් අතරින් ඔවුන්ගේ පවතින ආදායම් මට්ටම් පදනම් කරගෙනය. මේ යටතේ ප්‍රතිලාභ ලැබීමට සුදුසු වන්නේ ආහාර මුද්දර ලාභියාගේ පවුලේ ආදායම මසකට රු 700 නොඉක්මවුවොත් පමණි. වසර 2 ක් තුල ක්‍රියාත්මක වන ජනසවිය වැඩසටහන මගින් ආහාර හා ආරක්ෂණය සැපයීම මගින් දිළිඳු ජනතාවගේ ජීවන තත්වය නැංවීමට ක්‍රියාකරන ලදි. මේ යටතේ ප්‍රතිලාභීන්ට මසකට රු 2500/- ක දීමනාවක් හිමි වූ අතර ඉන් කොටසක් ඉතිරි කිරීමේ ගිණුමක තැන්පත් කල යුතු විය. ජනසවිය වැඩසටහනින් අපේක්ෂිත අරමුණු අතර ප්‍රතිලාභී පවුල්වල ආදායම වර්ධනය කිරිම, නව ජීවන වෘත්තියක් හඳුන්වාදීම, රජය මත යැපීමකින් තොරව ස්වශක්තියෙන් නැගී සිටිය හැකි පුද්ගලයෙක් බිහි කිරීම දැකිය හැකිය. ජනසවිය වැඩසටහනෙහි විශේෂත්වය වන්නේ ප්‍රතිලාභීන් ලෙස තෝරා ගනු ලැබූ ඒකක මසකට දින 20 ක් ඵලදායි වැඩසටහනක නියුතු විය යුතු අතර එසේ නොවීම ප්‍රතිලාභී හිමිකම ගිලිහීමට හේතු විය (ගමගේ, 1998).

**ජනසවිය භාරකාර අරමුදල**

ජනසවිය භාරකාර අරමුදල පිහිටවනු ලැබුවේ 1992 වසරෙහි වන අතර රැකියා විරහිත තරුණ තරුණියන්ට ආදායම් ඉපයුම් අවස්ථා හඳුන්වා දීම, එම ඉපයුම් අවස්ථා වර්ධනය කිරීම හා ආධාර සැපයීම මෙන්ම අවුරුදු පහට අඩු ළමුන් ගර්භනී මව්වරුන් හා කිරිදෙන මව්වරුන්ගේ පෝෂණ අවශ්‍යතාවන් සපුරාලීමට පහසුකම් සැපයීම මෙහි ප්‍රධාන පරමාර්ථ විය. ජනසවිය භාරකාර අරමුදලෙහි විෂය පථය ක්ෂේත්‍ර කිහිපයක් ඔස්සේ විහිදී ගිය අතර ප්‍රජා ව්‍යාපෘති, ණයසහන, පෝෂණ වැඩසටහන්, මානව සම්පත් හා ආයතනික සුබසාධනය ඒ තුල විය. ජනසවිය භාරකාර අරමුදල මැදිහත් වු විශේෂ අවස්ථාවක් ලෙස සමාජ ඒකරාශීකරණය හඳුන්වා දිය හැකිය. වාරි ව්‍යාපෘති, මහාමාර්ග, පාංශු සංරක්ෂණය, ප්‍රජා සංවර්ධන, ජල සම්පාදන හා සනීපාරක්ෂක ව්‍යාපෘති ජනසවිය භාරකාර අරමුදල විසින් ක්‍රියාත්මක කරන ලදි (ගමගේ, 1998).

**සමෘද්ධි වැඩසටහන**

දිළිඳු බව අඩු කිරීම සඳහා නිදහසින් පසුව විවිධ සුබසාධන ව්‍යාපෘති පවතින රජයන් හඳුන්වා දුන් අතර මෑත කාලයේ දී ක්‍රියාත්මක කරන ප්‍රධාන වැඩසටහන වන්නේ සමෘද්ධි ව්‍යාපාරයයි. 1994 දී බලයට පත් වූ නව රජය එතෙක් ක්‍රියාත්මක වූ ජනසවිය වැඩසටහන වෙනුවට සමෘද්ධි වැඩසටහන ක්‍රියාත්මක කරනු ලැබීය. සමෘද්ධි වැඩසටහන ප්‍රධාන අංශ 4 කින් සමන්විත විය.

1. සහනාධාර වැඩසටහන - අඩු ආදායම්ලාභී පවුල් සඳහා එදිනෙදා අත්‍යාවශ්‍ය ආහාර මිලට ගැනීමට මාසික දීමනාවක් ලබාදීම.

2. සමාජ ආරක්ෂණ වැඩසටහන - මුදල් ආධාර, වියළි සලාක, පෝෂණ වැඩසටහන්, ආපදා සහන වැඩසටහන්.

3. ප්‍රජා ව්‍යාපෘති- ග්‍රාමීය මාර්ග සංවර්ධන ව්‍යාපෘති, ජල සම්පාදන ව්‍යාපෘති.

4. බැංකු සංගම් ව්‍යාපෘති- දිළිඳු ජනතාවගේ ඉතුරුම් ශක්‍යතාව වර්ධනය, බැංකු පුරුදු වර්ධනය, ණය පහසුකම් සම්පාදනය.

සමෘද්ධි සංවර්ධන වැඩසටහන යටතේ ක්‍රියාත්මක ව්‍යාපෘති අතුරින් අඩු ආදායම්ලාභී පවුල්වල ආර්ථික ස්ථාවරත්වයක් ඇතිකිරීම උදෙසා ග්‍රාමීය සංවර්ධන වැඩසටහන ප්‍රධාන සංරචකයක් ලෙස ගත හැකිය. ඒ අනුව ග්‍රාමීය සංවර්ධනවැඩසටහන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස 317 කට අයත් ගම් 3060 ක ග්‍රාමීය යටිතල පහසුකම් සංවර්ධනය උදෙසා ක්‍රියාත්මකය. එක් ගමකට රුපියල් දස ලක්ෂයක් සමෘද්ධි අධිකාරිය විසින් ලබාදුන් අතර 2008 වසරේ දී රු . මිලියන 800 ක වටිනාකමකින් යුතු යටිතල පහසුකම් වර්ධනයක් සිදුව ඇත. "ගැමි පුබුදුව" වැඩසටහන මේ යටතේ ක්‍රියාත්මක ව්‍යාපෘතියකි. මේ යටතේ 2005 වසරේ සංවර්ධන ව්‍යාපෘති 10800 ක් ක්‍රියාත්මක වූ අතර මෙම වැඩසටහනේ ශ්‍රම දායකත්වය සැපයෙන්නේ සමෘද්ධි ලාභීන්ගෙන් වීම විශේෂත්වයකි. ස්වයං රැකියා ව්‍යාපෘති හා යටිතල පහසුකම් තුලින් සමෘද්ධිලාභී පවුල්වල මාසික ආදායම රු 5000 දක්වා වැඩි කිරීම අපේක්ෂා කර ඇත (කලුආරච්චි, 2014).

**සමෘද්ධි වැඩසටහනෙහි පවතින සීමාකම් (විවේචන)**

දිළිඳුකම පිටුදැකීමේ ව්‍යාපෘතියක් රටකට අවශ්‍ය වන්නේ දිළිඳුකම සදහටම තුරන් කිරීමට නොව දුප්පත්කම හැකිතාක් අවම කිරීමටයි. ඒ සඳහා උක්ත ව්‍යාපෘති මගින් ප්‍රතිලාභ දිළිඳු ජනයා වෙත ගලා යා යුතුය.මෙහිදී වඩාත් වැදගත් වනුයේ මාළුවෙක් වෙනුවට බිලීපිත්තක් ලබා දීමයි. ආර්ථිකමය වශයෙන් දුප්පත්කම නැති කිරීම යනු දිළිඳු ප්‍රතිශතය අවම කිරීමයි. ජන හා සංඛ්‍යාලේඛණ දෙපාර්තමේන්තුවේ ගෘහ ඒකක ආදායම් හා වියදම් සමීක්ෂණයන්ට අනුව 2005 වසරේදී දරිද්‍රතාවෙන් පෙලෙන ජනගහණය 15.2 % වූ අතර එය 2010 වන විට 7.6 % දක්වා අඩු වූ අතර වර්ෂ 2016 දී දරිද්‍රතාව 4.2 % දක්වා අඩුකර ගැනීමට අපේක්ෂිතය (ගනේවත්ත, 2011).

සමෘද්ධි ව්‍යාපාරය තුල ප්‍රතිලාභීන් නිවැරදිව ඉලක්කගත කර නොමැති බව ලෝක බැංකුව විසින් කරන ලද අධ්‍යනයකින් මෙන්ම ජන හා සංඛ්‍යාලේඛණ දෙපාර්තමේන්තුවේ ගෘහ ඒකක ආදායම් වියදම් සමීක්ෂණ හා සමෘද්ධිලාභී කුටුම්භ ප්‍රමාණය සැසඳීම තුලින් හෙළිකර ගත හැක. ලෝක බැංකුව අධ්‍යයන වාර්තාවෙන් මෙරට දිළිඳු ජනතාවගෙන් 40% ක් පමණ සංඛ්‍යාවක් සමෘද්ධි වැඩසටහනින් බැහැර කොට ඇති බවත් දැක්වේ. ජන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තු වාර්තා මෙම තත්වය තව දුරටත් තහවුරු කරන අතර 2002 වර්ෂයේ සමෘද්ධි ප්‍රතිලාභ හිමි වූයේ පහලම ආදායම් දශමකයේ සිටි කුටුම්භ අතුරින් 52.6% කට පමණකි (කලුආරච්චි, 2014).

සමෘද්ධි වැඩසටහනට එල්ල වූ ප්‍රබල විවේචනයක් ලෙස දිළිඳු ජනතාව නිසි ලෙස කේන්ද්‍රගත නොවීම දැක්විය හැක. එනම් තවමත් නුසුදුස්සන් විශාල පිරිසක් සමෘද්ධි සහනාධාර ලබාගන්නා බවයි. ශ්‍රී ලංකා මහාබැංකු 2009 වාර්ෂික වාර්තාව අනුව "රටේ ජනගහණයෙන් 32%ක් සමෘද්ධි සහනාධාර තුලින් ප්‍රතිලාභ ලබයි. 15.2% ක් වූ දරිද්‍රතාවෙන් පෙලෙන ජනගහණය (2006/2007 සමීක්ෂණය)හා සැසඳීමේදී 32% ක් වු සමෘද්ධලාභීන්ගේ ප්‍රමාණය සැලකිය යුතු ඉහල අගයකි" (ගනේවත්ත, 2011).

මෙලෙස  ශ්‍රී ලංකාවේ දිස්ත්‍රික්ක අනුව සමෘද්ධි ප්‍රතිලාභී කුටුම්භ ප්‍රතිශතය දිළිඳු කුටුම්භ ප්‍රතිශතයට වඩා වැඩි අගයක් ගැනිමට හේතුවී ඇත්තේ සමෘද්ධිලාභීන් තේරීමේ දී නිවැරදිව ඉලක්ක කර නොතිබීමයි. ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනය(IPS ) වාර්තා අනුව සමෘද්ධි වැඩසටහන ක්‍රියාත්මක වන සියළු දිස්ත්‍රික්කවල දිළිඳු කුටුම්භ ප්‍රතිශතය ඉක්මවන සමෘද්ධි ප්‍රතිලාභී ප්‍රතිශතයක් පැවතින අතර එය වගු අංක 1න් දැක්වේ.

වගු අංක 1 - දිළිඳු කුටුම්භ ප්‍රතිශතය ඉක්මවන සමෘද්ධි ප්‍රතිලාභී ප්‍රතිශතය

| දිස්ත්‍රික්කය | දිළිඳු කුටුම්භ ප්‍රතිශතය | සමෘද්ධිලාභී කුටුම්භ ප්‍රතිශතය | ප්‍රතිශතක වෙනස |
|---|---|---|---|
| ගම්පහ | 7.2 | 34 | 26.8 |
| ගාල්ල | 10.7 | 41 | 30.3 |
| මාතර | 11.7 | 45 | 43.3 |
| පොළොන්නරුව | 10.0 | 39 | 29.0 |
| කළුතර | 10.3 | 30 | 19.7 |

මූලාශ්‍රය : කලුආරච්චි, 2014

සමෘද්ධි ප්‍රතිලාභීන් තේරීමේදී මෙන්ම සමෘද්ධි වැඩසටහනේ කාර්ය මණ්ඩලයද දේශපාලනීකරණය වීම මෙම වැඩසටහනින් අපේක්ෂිත ප්‍රතිඵල වෙත ප්‍රවේශ වීමට

බාධා පමුණුවා ඇත. දිළිඳුකම තුරන් කිරීමේ වැඩසටහනක් වශයෙන් සමෘද්ධි ව්‍යාපාරයේ ආයතනික ව්‍යුහය කාර්යක්ෂම නොවනවා පමණක් නොව සුවිශාල පරිපාලන ව්‍යුහයක් රජය හෝ අනෙකුත් පාර්ශවයක් මත පෝෂණය වන පරාධීන සංස්කෘතියක් බිහිවීමත් සමෘද්ධි ව්‍යාපාරයේ දුර්වලතා ලෙස හඳුනාගත හැක. ප්‍රධාන ව්‍යාපෘති අතර සම්බන්ධීකරණයක් නොවීම, ප්‍රතිලාභීන් තේරීමේදි සුළු ජන වර්ග නොසලකා හැරීම ද මේ යටතේ ගත හැකි ය.

## දිවිනැගුම

2012 අයවැය ලේඛනය මගින් හඳුන්වාදුන් "දිවිනැගුම" වැඩසටහන මගින් අපේක්ෂිත ප්‍රධාන අරමුණ වුයේ කුටුම්බවලට තම එදානෙදා පරිභෝජනයට අවශ්‍ය කෙරෙන එළවළු සහ පළතුරු තම ගෙවත්තේම නිපදවීමත් දෛනික අවශ්‍යතා සඳහා වෙළඳපල පරායක්තතාව අඩු කිරීම සහ පවුල් ඒකකවල මූල්‍ය සුරක්ෂිතතාව ඇති කිරීමයි.

කුටුම්භ පෝෂණ මට්ටම් ඉහල නැංවීම, ජීවන වියදම් පහත හෙළීම, එළවළු හා පලතුරු නිෂ්පාදනය 25% න් ඉහල නැංවීම, ප්‍රතිශීර්ෂ එලවළු පරිභෝජනය දිනකට 134g සිට 175g දක්වා වැඩි කිරීම, ග්‍රාමීය ව්‍යවසායකයන් දිරිමත් කිරීම, ආර්ථික සංවර්ධන අමාත්‍යංශය මගින් ක්‍රියාත්මක කරන දිවිනැගුම වැඩසටහනෙහි කේන්ද්‍රිය අරමුණු ලෙස ගත හැකිය. 2011 මාර්තු මාසයේදි ආරම්භ කරන ලද දිවිනැගුම ප්‍රථම වටය යටතේ පවුල් මිලියනයක් සවිබල ගැන්වීමට ක්‍රියාකරන ලද අතර ඒ අනුව ග්‍රාම නිලධාරි වසමකට පවුල් 100 බැගින් තෝරාගනු ලැබිය. එලවළු හා පලතුරු වගාව, ගෘහස්ථ කර්මාන්ත ඇරඹීම මේ යටතේ අපේක්ෂා කල අතර රජය මගින් ඒ සඳහා පොහොර හා බීජ වර්ග සැපයීම, එලවළු හා පලතුරු පැල සැපයීම, ඖෂධ පැල සැපයීමත් සිදු කරන ලදි. 2011 ඔක්තෝම්බර් මස දිවිනැගුම දෙවැනි අදියර ක්‍රියාත්මක කර ඇති අතර එය කිලිනොච්චිය හැර ශ්‍රී ලංකාවේ සියලු දිස්ත්‍රික්ක තුල සක්‍රීයව ක්‍රියාත්මක වේ (කලුආරච්චි, 2014).

## ගැමිදිරිය

2004 දෙසැම්බර් මස ඇරඹුණු ගැමිදිරිය සංවර්ධන හා ජීවනෝපාය ව්‍යාපෘති සඳහා දොලොස් වසරක කාලපරිච්ඡේදයක් සඳහා ලෝක බැංකුව විසින් ඩොලර් මිලියන 181 ක් ලබාදි ඇති අතර ප්‍රජා මුලිකත්වයෙන් හා මෙහෙයවීමෙන් දිළිඳුකම තුරන්

කිරීම හා ග්‍රාමීය සංවර්ධනය කේන්ද්‍රකරගත් තිරසාර සංවර්ධනයක් ඇති කිරීම ප්‍රධාන අරමුණ විය. බදුල්ල, ගාල්ල, මාතර, හම්බන්තොට, රත්නපුර හා පොලොන්නරුව යන තෝරාගත් දිස්ත්‍රික්කවල දිලිඳුකම පිටුදැකීම උදෙසා ක්‍රියාත්මක වන ව්‍යාපෘතියක් ලෙස සැලකිය හැක.

ප්‍රජා සහභාගීත්වය සහ ගැමි ප්‍රජාව සවිබල ගැන්වීම මගින් ග්‍රාම සංවර්ධන කටයුතු සැලසුම්කර තිරසාර සංවර්ධනයක් අත්කර ගැනීම උදෙසා යෝග්‍ය ග්‍රාම සංවර්ධන ආකෘතියක් මගින් දිළිඳුකම අවම කිරීමට කටයුතු කිරීම ප්‍රධාන ලක්ෂණයකි. ග්‍රාමීය සංවර්ධන ප්‍රවේශයක් අනුව ගමේ සමීක්ෂණයක් සිදුකර ගමේ අවශ්‍යතා හඳුනාගෙන ගමේ සංවර්ධන සැලැස්ම ජනතාව විසින්ම අවශ්‍ය බාහිර සහය පමණක් යොදාගනිමින් සිදු කරයි. මේ අනුව ව්‍යාපෘති යෝජනා ප්‍රජාව විසින් 10% ක මූල්‍ය දායකත්වයක් සහ 20% ක ශ්‍රම දායකත්වය ලබාදීමට එකඟවීමෙන් පසුව අදාල ව්‍යාපෘති යෝජනා තාක්ෂණික, සමාජීය හා පාරිසරික වශයෙන් ඇගයීමට ලක්කර එහි නඩත්තුව ප්‍රජාව විසින්ම සිදුකරනු ලබන වැඩපිළිවෙලක් පිළිබඳව සෑහීමට පත්වීමෙන් පසු ජනතා සමාගමට අරමුදල් සෘජුවම ලබාදෙයි.

ප්‍රජා සංවර්ධනය හා ජීවනෝපාය මාර්ග වැඩි දියුණු කිරීම සඳහා ස්වයංතීරණ ගැනීම, සැලසුම්කරණය, සම්පත් මෙහෙයවීම, ක්‍රියාත්මක කිරීම, ප්‍රතිඵල ඇගයීම මුලික කොටගත් ආයතනික ව්‍යුහයක් පිහිටුවා ශක්තිමත්ව පවත්වා ගෙන යාමට ග්‍රාමීය ප්‍රජාව සවිබලගැන්වීම මෙහි ප්‍රධාන ලක්ෂණයකි (කලුආරච්චි, 2014).

මේ අනුව ශ්‍රී ලංකාවේ මෑතකාලින දිළිඳු ජනතාවට හිතකර වෘද්ධියක් ලඟාකරදීම අපේක්ෂාවෙන් දේශීය කෘෂිකර්මාන්තය නගා සිටුවීමට ගත් ක්‍රියාමාර්ගයක් ලෙස වී සඳහා සහතික මිල ක්‍රමය, පොහොර සහනාධාරය, දහසක් වැව් ව්‍යාපෘතිය, කිරි ගම්මාන ආදියත්, ග්‍රාමීය යටිතල පහසුකම් සංවර්ධන ව්‍යාපෘති ලෙස ගම නැගුම, මග නැගුම, ගොවි පුබුදුව, ගැමි දිරිය, ග්‍රාමීය විදුලිබල ව්‍යාපෘති ආදියත් ප්‍රාදේශීය සංවර්ධන ව්‍යාපෘති ලෙස පුබුදමු වෙල්ලස්ස, රජරට නවෝදය, නැගෙනහිර නවෝදය, උතුරු වසන්තය වැනි වැඩසටහන් දැක්විය හැක.

## සමාලෝචනය

ශ්‍රී ලංකාව තුළ ක්‍රියාත්මක දිළිඳුකම පිටු දැකීමේ ව්‍යාපෘතීන් හි ප්‍රධාන අරමුණ වූයේ දිළිඳුකම අවම කිරීම හා දිළිඳු ජනයාගේ ජීවන තත්වය නගා සිටුවාලීමය. ව්‍යාප්තිය මෙන්ම සක්‍රීය බවින්ද ප්‍රධාන ස්ථානයක් ගනු ලබන සමෘද්ධි වැඩසටහනෙහි ද ව්‍යුහාත්මක මෙන්ම උපායමාර්ගික ගැටළු දැකිය හැකි අතර ප්‍රතිලාභීන් නිසිලෙස ඉලක්ක ගත නොවීම ප්‍රධාන ගැටළුවකි. සහනාධාර ලබාදීම තුලින් දරිද්‍රතාව අවම කිරීම සිහිනයක් වන අතර එමගින් පෞද්ගලික සානුබල යටපත්ව පරාධීන යැපෙන්නන් පිරිසක් බිහි වන අතර මානව ප්‍රාග්ධනය සඵල ලෙස උපයෝගී කර ගැනීම සහතික කෙරෙන ශ්‍රම වෙළඳපල මෙහෙයුමක් තුලින් අපේක්ෂිත ඉලක්ක කරා ලඟා වීම පහසු කරවයි. දේශීය කෘෂිකර්මය නගා සිටුවීම, ග්‍රාමීය යටිතල පහසුකම් සංවර්ධනය, ක්ෂුද්‍ර මූල්‍ය, ප්‍රජා ව්‍යාපෘති මෙන්ම සමාජ සජීවීකරණය හා සවිබලගැන්වීම උක්ත ව්‍යාපෘතිවල හරය වන අතර පහල සිට ඉහලට යොමුවන වැඩසටහන් වශයෙන් මෙහි පවතින ඵලදායී බව හීන කිරීමට දේශපාලනීකරණය, අකාර්යක්ෂම බව, සම්බන්ධීකරණ ගැටළු ආදී විවිධාකාර හේතු බලපා ඇත. දරිද්‍රතා අනුපාතය ඉක්මවන සමෘද්ධි ප්‍රතිලාභීන් අනුපාතයක් සිටීම ඉහත ගැටළුවට සාක්ෂි සපය යි.

## ආශ්‍රිත ග්‍රන්ථ

කලුආරච්චි, ආර්. (2014), සංවර්ධන සංකල්ප හා ශ්‍රී ලංකා ආර්ථිකය,කතෘ ප්‍රකාශන

ගනේවත්ත, එස්.එන්. (2011), ආර්ථික යුද්ධය ජය ගැනීම, කතෘ ප්‍රකාශන

ගමගේ, එස්.අයි. (1998),ශ්‍රී ලංකාවේ ආර්ථික සංවර්ධනය,ඇම්. ඩී. ගුණසේන සහ සමාගම, කොළඹ 11

හිඳැල්ල ආරච්චි, සී.සී. (2004), සංවර්ධන අධ්‍යයනය, සරසවි ප්‍රකාශකයෝ

අබේසිංහ, ඒ.ඇම්.ජී.බී. (2011), සමූපාකාරය ප්‍රජා සංවර්ධනය හා කාන්තා සහභාගීත්වය, ආරිය ප්‍රකාශකයෝ, වරකාපොල